ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

ව්‍යාපාර පරිපාලනවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

පළමු වසර, දෙවන වසර සහ තුන්වන වසර පළමු සාමාසික විභාග පැවැත්වීම - 2025 ජූනි/ජූලි

# <u>විභාග අයදුම් කිරීම සඳහා පොදු උපදෙස්</u>

- ඉහත උපාධි පාඨමාලාවේ පළමු, දෙවන සහ තුන්වන වසර පළමු සාමාසික විභාග 2025 වර්ෂයේ ජූනි මස 28 වන දින සිට සති අන්ත සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හි දී සියලුම අධ්‍යයන මධ්‍යස්ථාන වල දී පැවැත්වේ.

- Intake VI (2018), Intake VII (2019) සහ Intake VIII (2020) යන කණ්ඩායම්වල ලියාපදිංචි වී සාමාසික හයටම (06) මුදල් ගෙවා ලියාපදිංචි වූ සිසුන් පමනක් රුපියල් 1500.00 ක මුදලක් ගෙවා 2025 වර්ෂයට ලියාපදිංචි වී පුණර් විෂයන් සඳහා අයදුම් කළ යුතුය.

- Intake VI (2018) කණ්ඩායමේ ලියාපදිංචි සිසුන්ගේ අවසන් වර්ෂය මෙය වන අතර නැවත VI (2018) කණ්ඩායමේ ලියාපදිංචි සිසුන්ට පළමු වසර, දෙවන වසර සහ තුන්වන වසර පළමු සාමාසික විභාගයකට අයදුම් කළ නොහැකි අතර විභාගයට පෙනී සිටීම අනිවාර්යවේ.

- Intake VI (2018) කණ්ඩායමේ ලියාපදිංචි සිසුන් හතර වතාවකට (04) වඩා පළමු වසර සහ දෙවන වසර පළමු සාමාසික විභාගයට පෙනී සිට ඇත්නම්, විභාග අයදුම් පත්‍රය සමඟ විශේෂ විභාග අයදුම්පත්‍රය පුරවා සනාතන සභාවෙන් අවසර ලබාගත යුතුය. එසේ නොකර හතර වතාවකට (04) වඩා විභාගයට පෙනී සිට ඇත්නම් අවසන් වරට පෙනීසිටි විභාගයේ විභාග ප්‍රති ල අත්හිටවීමට විශ්වවිද්‍යාලයට බලය ඇති බව ඔබට දැනුම් දෙමි. (විශේෂ විභාග අයදුම්පත්‍රය https://fms.rjt.ac.lk/wp-content/uploads/2023/06/Grace-Chance-Application.pdf ලබාගත හැක)

- Intake VII (2019) කණ්ඩායමේ ලියාපදිංචි සිසුන් හතර වතාවකට (04) වඩා පළමු වසර පළමු සාමාසික විභාගයට පෙනී සිට ඇත්නම්, විභාග අයදුම් පත්‍රය සමඟ විශේෂ විභාග අයදුම්පත්‍රය පුරවා සනාතන සභාවෙන් අවසර ලබාගත යුතුය. එසේ නොකර හතර වතාවකට (04) වඩා විභාගයට පෙනී සිට ඇත්නම් අවසන් වරට පෙනීසිටි විභාගයේ විභාග ප්‍රතිඵල අත්හිටවීමට විශ්වවිද්‍යාලයට බලය ඇති බව ඔබට දැනුම් දෙමි. (විශේෂ විභාග අයදුම්පත්‍රය https://fms.rjt.ac.lk/wp-content/uploads/2023/06/Grace-Chance-Application.pdf ලබාගත හැක)

- ඔබ පෙනී නොසිටි ඕනෑම විෂයක් නැවත අයදුම් කිරීමේ දී (පුණර් හෝ වෛද්‍ය) රුපියල් 1200.00 ක මුදලක් ගෙවිය යුතුය. (ඔබ විභාගයට පෙනී නොසිට වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කරන්නේ නම් රුපියල් 1000.00 මුදලක් අයදුම්පත් ගාස්තු ලෙස ගෙවා නියමිත අයදුම් පත්‍රය පුරවා පෙනී නොසිටි විෂය පැවැත් වූ දින සිට දින 14 ක් ඇතුලත දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයට ඔබගේ වෛද්‍ය සහතිකය ලැබී තිබිය යුතුය.)

- විභාග අයදුම් පත්‍රය, උපදෙස් පත්‍රිකාව සහ මුදල් ගෙවන වවුචර් පත https://www.rjt.ac.lk/ යන ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් බාගත (Download) කරගත හැකිය.

- විභාග අයදුම්පත්‍රය නිසි ලෙස සම්පූර්ණ කර 2025 මැයි මස 28 වන දිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ පැමිණ ගෙනවිත් බාර දිය යුතුය. විභාග ප්‍රවේශ පත්‍රය ඔබගේ විද්‍යුත් ලිපිනයට (email) එවනු ලැබේ.

- විභාග අයදුම් පත්‍රය යොමු කරන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "2025 BBA විභාග අයදුම් පත්‍රය " ලෙස සඳහන් කල යුතුය.

- ඔබ අයදුම් කළ විභාග මධ්‍යස්ථානයට පමනක් විභාගය සඳහා පැමිණිය යුතුය. වැරදි විභාග මධ්‍යස්ථානයක් විභාග අදුම්පතේ සදහන් වී ඇත්නම් විභාගයට දින 07කට පෙර පහත දුරකථන අංකයට හෝ විද්‍යුත් ලිපිනය මඟින් අප වෙත දන්වා විභාග අයදුම්පත්‍රය නිවැරදි කරවා ගත යුතුය.

- විභාගය ආරම්භවීමට විනාඩි 30 කට ප්‍රථම තමාගේ විභාග මධ්‍යස්ථානය වෙත පැමිණිය යුතු අතර විභාගය ආරම්භ වී විනාඩි 30 ක් ගත වූ පසු ඔබට විභාග ශාලාවට ඇතුලු වීමට අවසර නොදේ.

- විභාග අයදුම්පත්‍රයක් නොමැති හෝ වැරදි විභාග මධ්‍යස්ථානයකට පැමිණෙන කිසිදු විභාග අපේක්ෂකයෙකුට විභාගය සඳහා පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

- විභාගය සඳහා පෙනී සිටින සෑම මෙහොතකම විභාග අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා විශ්වවිද්‍යාලය මඟින් නිකුත් කර ඇති ශිෂ්‍ය හැඳුනුම්පත සහ ජාතික හැඳුනුම්පත විභාග අයදුම්කරු සතුව තිබිය යුතුය.

- ඔබ විශේෂ අවශ්‍යතා ඇති විභාග අයදුම් කරුවෙකු නම් විභාගය ආරම්භ වීමට ප්‍රථම විභාග ශාලාධිපතිට ඒ බව දැනුම් දෙන්න.

- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය මඟින් විභාග නීති රීති උල්ලංඝණය කරන සිසුන් සඳහා දැඩි දඬුවම් ලබා දෙන බැවින් සියලුම සිසුන් විභාග නීති රීති උල්ලංඝණය නොකරන ලෙස දන්වමි.

- විභාග අයදුම්පත් යොමුකළ යුතු ලිපිනය

  සහකාර ලේඛකාධිකාරී/විභාග
  ව්‍යාපාර පරිපාලනවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව
  දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය
  බුලන්කුලම දිසා මාවත
  දෙවන පියවර
  අනුරාධපුර

- විමසීම් - 025 2260220 exam@cdce.rjt.ac.lk

- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය විසින් 2025 ජනවාරි මස 01 වන දින සිට ඉහත සඳහන් විභාග ගාස්තු සංශෝධනයට කර ඇති බව දැනුම් දෙමි.

සහකාර ලේඛකාධිකාරී/විභාග
ව්‍යාපාර පරිපාලනවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය

2025.05.21